# ප්‍රස්තාර - I

**1** පුවත්පත් අලෙවි සලක දිනක දී විකුණන ලද පුවත්පත් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| පුවත්පත | විකුණන ලද පුවත්පත් ගණන |
|---|---|
| මිහිරි | 10 |
| සුරත | 8 |
| දියත | 7 |
| දිමුතු | 2 |
| නුවණ | 8 |

■ ඉහත තොරතුරු තීර ප්‍රස්තාරයකින් නිරූපණය කරමු.




■ තීර ප්‍රස්තාරය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(1) වැඩි ම ප්‍රමාණයක් විකුණන ලද පුවත්පත කුමක් ද?
(2) අඩු ම ප්‍රමාණයක් විකුණන ලද පුවත්පත කුමක් ද?
(3) සමාන ප්‍රමාණවලින් විකුණා ඇති පුවත්පත් මොනවා ද?
(4) දිමුතු පුවත්පතට වඩා සුරත පුවත්පත් කීයක් වැඩියෙන් විකිණී තිබේ ද?
(5) මිහිරි පුවත්පතට වඩා සුරත පුවත්පත් කීයක් අඩුවෙන් විකිණී තිබේ ද?



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# ප්‍රස්තාර - 1



**2** පන්තියක ජනවාරි, පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් මාසවල ඉපදුණු ළමයින් පිළිබඳ තොරතුරු පහත රූපයෙන් දැක්වේ. එය ඇසුරෙන් පහත වගුව පුරවන්න.




| ඉපදුණු මාසය | වාර්තා කළ අයුරු | ළමයින් ගණන |
|---|---|---|
| ජනවාරි | ///// | 5 |
| පෙබරවාරි | | |
| මාර්තු | | |
| අප්‍රේල් | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# ප්‍රස්තාර - 1

10

■ වගුව ඇසුරෙන් පහත දැක්වෙන තීර ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න.




■ තීර ප්‍රස්තාරය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(1) වැඩි ම ළමයින් ගණනක් ඉපදී ඇති මාසය කුමක් ද?

(2) අප්‍රේල් මාසයේ ඉපදී ඇති ළමයින් ගණන කීය ද?

(3) සමාන ළමයින් ගණනක් ඉපදී ඇති මාස මොනවා ද?

(4) අප්‍රේල් මාසයට වඩා මාර්තු මාසයේ ඉපදී ඇති ළමයින් ගණන කීය ද?





නොමිලේ බෙදා හැරීම සඳහා ය.